# බෝංචි වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## රූපමය කාඩ් පත්

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
www.safe.doa.gov.lk

# බෝංචි වගාව රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## තාක්ෂණික දායකත්වය


- **ආචාර්ය පී. එච්. රණවීර** - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- **එම්. එස්. ඩබ්. ප්‍රනාන්දු** - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- **කේ. පුෂ්පාංජී** - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- **එච්. ඒ. එස්. එන්. හෙට්ටිආරච්චි** - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- **ටී. කේ. ඒ. අයි. හජ්ජී** - ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල
- **ආචාර්ය ජේ. පී. මාරසිංහ** - පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, පේරාදෙණිය


## සැකසුම


- **පී. එස්. පී. තෙන්නකෝන්** - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව
- **කේ. ඒ. යු. එන්. එන්. බණ්ඩාර** - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව





කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024

# බෝංචි කරල් විදින පණුවා



**හානි වූ කරලක්**

කීටයන් කරල ආහාරයට ගැනීම නිසා අක්‍රමවත් හෝ රවුම් සිදුරු ඇතිවේ. සිදුරු අසළ අපද්‍රව්‍ය දැකිය හැකිය.



**කීටයා**

කීටයාගේ ශරීරය ක්‍රීම් පැහැතිය. කළු තිත් පේළි දෙකක් ඇත. කීටයා කරල් තුළට ඇතුළු වී එහි කොටස් ආහාරයට ගනී.



**කීටයා (පුෂ්ප මත)**

කීටයන් පුෂ්ප (මල් කැකුළු) ද ආහාරයට ගනී. වගාවක පුෂ්ප හටගන්නා අවස්ථාවේදී හානිය ආරම්භ විය හැක.



**සුහුඹුල් සලබයා**

පියාපත් දිගහැර ඇති විට මි.මී. 20ක් 30ක් පමණ වේ. පියාපත් ලා දුඹුරු පැහැති අතර සුදු පැහැයට හුරු රේඛා ඇත.

# බෝංචි කරල් විදින පණුවා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| එටොෆෙන්ප්‍රොක්ස් 100 g/l EC | මි.ලී. 24 |
| නොවලියුරෝන් 100 g/l EC | මි.ලී. 16 |
| ක්ලෝෆ්ලූවසියුරෝන් 50 g/l EC | මි.ලී. 16 |
| ෆ්ලූබෙන්ඩියාමයිඩ් 24% WG | ග්‍රෑම් 02 |
| ක්ලොරන්ට්‍රානිලිප්‍රෝල් 200 g/l SC | මි.ලී. 05 |
| ක්ලොරන්ට්‍රානිලිප්‍රෝල් 20% + තයාමෙතොක්සාම් 20% WG | ග්‍රෑම් 2.4 |
| තයෝඩිකාබ් 375 g/l EC | මි.ලී. 32 |
| ඉන්ඩොක්සාකාබ් 150 g/l EC | මි.ලී. 6.5 |

* 50% මල් පිපීමත් සමගම නිර්දේශිත කෘමිනාශකයක් යෙදීම.



## වෙනත් පාලන ක්‍රම

- හානි වූ කරල් එකතුකර විනාශ කිරීම.
- අස්වනු නෙළීමෙන් පසු හානිවූ කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම.
- කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම.
- සලබයන් විකර්ෂණය සඳහා නිපදවා ඇති විශේෂිත කහ බල්බ ඇටවුම භාවිතා කිරීම.

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්ධනය කිරීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බෝංචි මැස්සා



### හානිවූ ශාකයක්

කීටයන් කඳට ඇතුළු වී හානි කිරීමත් කෝෂගත වීමත් නිසා ශාක කහ පැහැයට හැරී මැලවී යයි. කඳ කපා බැලුවිට කීටයන් හෝ කෝෂ දැකිය හැක.



### කීටයන්

ක්‍රීම් පැහැයක් ගන්නා අතර මි.මී. 3 ක් පමණ දිගය. කඳ පාදස්ථයේ කෝෂ ගත වේ.



### සුහුඹුලා

මි.මී. 3 ක් පමණ වේ. දිලිසෙන කළු පැහැයක් ගනී. විනිවිද පෙනෙන පියාපත් ඇත. ප්‍රධානව බීජ පැළවල පළමු පත්‍ර දෙක අතර බිත්තර දමයි. මල් පිපෙන අවස්ථාවේදී පත්‍ර මත බිත්තර දමයි.



# බෝංචි මැස්සා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| කාබෝසල්ෆාන් 200 g/l EC | මි.ලී. 48 |

- බීජ ප්‍රතිකාර කර නොමැතිවිට පැලයේ කොළ 2 ක් මතුවනවිට (දින 07) යෙදීම
- අවශ්‍ය නම් සති 2කට පසුව නැවත යොදන්න
- හානිය දරුණු නම් මල් පිපෙන අවස්ථාවේදී නැවත යොදන්න



## වෙනත් පාලන ක්‍රම

- හානිවූ පැල ගලවා විනාශ කර දැමීම

## වළක්වා ගැනීම

- බීජ ප්‍රතිකාරයක් ලෙස තයාමෙතොක්සාම් 70% WS ග්‍රෑම් 1.5 ක් ජලය මි.ලී. 10 ක දියකර බීජ කි.ග්‍රෑ. 1 ට එකතු කර පැය 24ක් තබා සිටුවීම
- අමතර මුල් සෑදීම උත්තේජනය සඳහා පැලයේ පාදස්ථ ප්‍රදේශයට පස් මුදුන් කිරීම
- පෙර කන්නයේ බෝග අවශේෂ ඉවත් කර විනාශ කිරීම
- බෝග මාරුව සිදු කිරීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පත්‍ර කණින්නා



**හානි වූ පත්‍ර**

කීටයා පත්‍ර මධ්‍යයේ මෘදුස්තරය කා දැමීම නිසා පැන්සල් ඉරි මෙන් සුදු පැහැති රටා ඇතිවේ. රටා කෙළවර කෝෂ ගත වේ.



**හානි වූ පත්‍ර (පසු අවස්ථාව)**

කා දැමීම නිසා ඇති වූ රටා අවපැහැයට හැරේ.



**සුහුඹුල් මැස්සා**

මි.මී. 2ක් පමණ වේ. දිලිසෙන කළු පැහැයක් ගනී. පියාපත් දෙක අතර ප්‍රදේශය, මුහුණ සහ ශරීරයේ යට පැත්ත කහ පැහැතිය. පත්‍ර තලය මත බිත්තර දමයි.



# පත්‍ර කණින්නා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- මෙම පලිබෝධකයාට නිර්දේශිත කෘමිනාශක නැත.

## වෙනත් පාලන ක්‍රම

- හානියේ මුල් අවස්ථාවේදීම හානිකල කළ පත්‍ර ඉවත්කර විනාශ කිරීම
- හානියේ මුල් අවස්ථාවේදීම කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම
- ජෛව පාලකයින් යොදා ගැනීම

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම
- වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම
- බෝග මාරුව සිදුකිරීම
- නිසි පරිදි පස සකස් කිරීම
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මයිටාවන්



**හානි වූ පත්‍රයක්**

ලපටි පත්‍රවල යටි පැත්තේ සිට යුෂ උරා බීමෙන් පත්‍ර යටි අතට නැමෙයි.



**හානි වූ පත්‍රයක් (යටිපැත්ත)**

පත්‍රවල යටිපැත්ත දුඹුරු පැහැයක් ගනී.



**හානි වූ පත්‍ර**

හානිය අධික වූ විට විකෘති වේ. කහ පැහැයට හුරු දුඹුරු පැහැයක් ගනී.



**සුහුඹුල් මයිටාවන්**

මි.මි. 0.4-0.5 පමණ වේ. පියවි ඇසට දැකීම අසීරුය. කහ පැහැයට හුරු දුඹුරු පැහැයක්ග නී.



# මයිටාවන්

## රසායනික පාලනය - නිර්දේශිත මයිටානාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ඇබමෙක්ටින් 18 g/l EC | මි.ලී. 10 |

## වෙනත් පාලන ක්‍රම

- ❖ විසුරුම් ජල සම්පාදනය භාවිතා කිරීම
- ❖ හානියේ මුල් අවස්ථාවේදීම හානිකල කළ පත්‍ර ඉවත්කර විනාශ කිරීම
- ❖ හානිය මුල් අවස්ථාවේදීම කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම
- ❖ ජෛව පාලකයින් යොදා ගැනීම
- ❖ බෝග සනීපාරක්ෂාව හා නඩත්තුව පවත්වා ගැනීම

## වළක්වා ගැනීම

- ❖ වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම
- ❖ ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බෝංචි කොල්ලු කහ විචිත්‍ර වෛරසය



**මුල් අවස්ථාවේදී ආසාදිත පත්‍රයක්**

ශාක වලට සති 3 – 4 කාලයේදී නොමේරූ පත්‍රවල විසිරුනු කුඩා කහ පැහැති පුල්ලි ඇතිවේ.



**පසු අවස්ථාවේ ආසාදිත පත්‍ර**

පැල්ලම් විශාලවී පසු කාලීනව දුඹුරු පැහැවී පත්‍ර මියයයි.



**ආසාදිත ශාකයක්**

වර්ධනය බාලවේ. පත්‍ර කුඩාවේ. පත්‍ර වල දිග අඩුවේ.



**සුදුමැස්සා**

මි.මී. 1–2 පමණ වේ. සුදු පැහැතිය. රෝග වාහකයා වේ. ආසාදිත ශාක වලින් යුෂ උරා බී නිරෝගී ශාක වල යුෂ උරාබීමෙන් වෛයිරස් රෝගය පතුරුවයි.



# බෝංචි කොල්ලු කහ විචිත්‍ර වෛරසය

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

(වාහකයා පාලනය සඳහා)

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලොරන්ට්‍රානිලිප්‍රෝල් 20% + තයාමෙතොක්සාම් 20% WG | ග්‍රෑම් 4.8 |
| තයෝසයික්ලාම් (හයිඩ්‍රජන් ඔක්සෙල්ට්) 50% SP | ග්‍රෑම් 40 |
| සල්ෆොක්සාෆ්ලෝර් 50% WG | ග්‍රෑම් 05 |
| පයිමෙට්‍රෝසීන් 50% WG | ග්‍රෑම් 08 |
| ඇසඩිරැක්ටින් 50 g/l EC | මි.ලී. 16 |

* බෝංචි සිටුවා දින 10 යේ සිට දින 10 ක කාලාන්තරයකින් මාරුවෙන් මාරුවට කුඩා කරල් අවස්ථාව තෙක් යෙදීම සඳහා

## වෙනත් පාලන ක්‍රම

- රෝගී පැල වහාම ගලවා විනාශ කිරීම
- බෝංචි සිටුවීමට සති 03 කට පෙර ක්ෂේත්‍රය වටා ආවරණයක් / බාධකයක් යෙදීම

## වළක්වා ගැනීම

- බෝග අවශේෂ ආර්ථික අස්වැන්න නෙලීම නතර කළ වහාම ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම
- නිරෝගී ගුණාත්මක බීජ භාවිතා කිරීම
- යායේ ගොවින් එකවර වගාකිරීම
- වල් පැල වලින් තොරව ක්ෂේත්‍රය පිරිසිදුව තබාගැනීම
- බීජ ප්‍රතිකාර කිරීම (බීජ කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා කෘසර් ග්‍රෑම් 3.5 ක් ජලය මි.ලී. 10 ක මිශ්‍ර කර මිශ්‍රණය හොඳින් බීජ සියල්ලෙහි තැවරෙන ලෙස කලවම්කර පැය 24 ක් තබා සිටුවීම)



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# කෝණාකාර පත්‍ර ලප රෝගය







**මුල් අවස්ථාවේදී ආසාදිත පත්‍රයක්**

දීලිරයක් මඟින් ඇති කරයි. පත්‍ර නාරටි වලට මායිම් වු කෝණාකාර ලප පත්‍ර තලයේ ඇතිවේ. ආරම්භයේදී අළු දුඹුරු පැහැති ලප පසුව තද දුඹුරු පැහැ ගනී. මේරූ පත්‍ර වල රෝග ලක්ෂණ මුලින් දිස් වේ.

**පසු අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

ලප ක්‍රමයෙන් විශාල වී එකතු වී පත්‍රයේ සැලකිය යුතු කොටසක් වියලී මැරී යයි.

**ආසදිත කරල්**

ආසාදනය අධික විට රතු දුඹුරු පැහැති ලප කරල් වල ද ඇතිවේ.

# කෝණාකාර පත්‍ර ලප රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ප්‍රොපිකොනසොල් 250 g/l EC | මි.ලී. 06* |
| හෙක්සාකොනසොල් 50 g/l EC | මි.ලී. 06* |
| හෙක්සාකොනසොල් 50 g/l SC | මි.ලී. 06* |
| ප්‍රොපිනෙබ් 70% WP | ග්‍රෑම් 32* |
| මෙතිරාම් 55% + පයිරක්ලොස්ට්‍රොබින් 5% WG | ග්‍රෑම් 32 |
| ටෙබුකොනසොල් 250 g/l EW | මි.ලී. 06* |
| ටෙබුකොනසොල් 200 g/l + ඇසොක්සිස්ට්‍රොබින් 120 SC | මි.ලී. 5.6 |



## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම
- නියමිත පරතරයෙන් සිටුවීම

- වර්ෂාව අධික කාලයක් නම් සංස්ථානික (*) හා ස්පර්ශක දිලීරනාශක මාරුවෙන් මාරුවට දින 7 ක කාලාන්තරයෙන් රෝගය පැතිරීම අඩු වන තෙක් ඉසීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# කළු පුල්ලි (ඇන්ත්‍රැක්නෝස්) රෝගය



**ආසාදිත පත්‍රයක්**

දීලීරයක් නිසා ඇතිවේ. ගඩොල් රතු පැහැය මිශ්‍ර තද දුඹුරු පාට ලප පත්‍ර යටි පැත්තේ නාරටි වල දැකිය හැක.



**ආසාදිත පත්‍රයක් (පසු අවස්ථාව)**

දිගටි ගිළුණු ලප ආකාරයට හැරේ. ආසාදනය උග්‍ර අවස්ථාවේදී පත්‍ර නටුවේ, කඳේ හා කරල් වල ලප ඇතිවේ.



**ආසාදිත කරල්**

කරල් වල ඇති වන ලප ගිළුණු වෘත්තාකාර වේ. තෙත් කාලගුණයක් ඇතිවිට රෝස පැහැති බීජාණු ආසාදිත ලප වල දැකිය හැක.



**ආසාදිත ශාකයක්**

කරල්වලට ආසාදනය වීමෙන් අස්වැන්න සැලකිය යුතු ලෙස අඩු වේ.

# කෑවී පුල්ලි (ඇන්ත්‍රැක්නෝස්) රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ප්‍රොපිකොනසෝල් 250 g/l EC | මි.ලී. 06* |
| හෙක්සාකොනසෝල් 50 g/l EC | මි.ලී. 06* |
| හෙක්සාකොනසෝල් 50 g/l SC | මි.ලී. 06* |
| ටෙබුකොනසෝල් 250 g/l EW | මි.ලී. 06* |
| ප්‍රොපිනෙබ් 70% WP | ග්‍රෑම් 32 |
| මෙතිරාම් 55% + පයිරක්ලොස්ට්‍රොබින් 5% WG | ග්‍රෑම් 32 |

- මුල් අවස්ථාවේම යෙදීමෙන් කරල් වලට වන හානිය වළක්වා ගත හැක.
- වර්ෂාව අධික කාලයක් නම් සංස්ථානික (*) හා ස්පර්ශක දිලීරනාශක මාරුවෙන් මාරුවට දින 7 ක කාලාන්තරයෙන් රෝගය පැතිරීම අඩු වන තෙක් ඉසීම



## වළක්වා ගැනීම

- ආසාදනය නොවු බීජ භාවිතා කිරීම.
- නිවැරදි කාලයට වගා කිරීම.
- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම
- අස්වැන්න නෙලීමෙන් පසු ඉතිරිවන හෝ හානිවූ ශාක කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත්කිරීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# ඕල්ටනේරියා පත්‍ර ලප රෝගය





**ආසාදිත පත්‍රයක් (මුල් අවස්ථාව)**

මුලින්ම කුඩා දුඹුරු පාට අක්‍රමවත් හැඩති ලප මේරූ පත්‍රවල ඇතිවේ. එම ලප ක්‍රමයෙන් විශාල වී වලයාකාර මෘදු ස්වාභාවයක් ගනී.

**ආසාදිත පත්‍රයක් (පසු අවස්ථාව)**

අධික ආසාදනයකදී විශාල වූ ලප එකතු වී පත්‍ර කහ පැහැ වී, වියලී හැලී යයි.



# ඕල්ටනේරියා පත්‍ර ලප රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- ✷ මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- ❖ ආසාදිත පත්‍ර ඉවත් කිරීම

## වළක්වා ගැනීම

- ❖ නියමිත පරතරයෙන් සිටුවීම
- ❖ ක්ෂේත්‍ර සනීපාරක්ෂාව



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මළකඩ රෝගය



**ආසාදිත පත්‍රයක් (යටි පැත්ත)**

කුඩා සුදු පැහැයට හුරු කහ පැහැති ඉහළට එසවුනු ලප යටි පැත්තේ ඇතිවේ.



**ආසාදිත පත්‍රයක් (උඩු පැත්ත)**

සුදු පැහැයට හුරු කහ පැහැති ලප ලෙස දිස්වේ.



**ආසාදිත පත්‍රයක් (පසු අවස්ථාව)**

සුදු පැහැයට හුරු කහ පැහැති ලප මධ්‍යයෙන් ක්‍රමානුකූලව විශාල වී රතු දුඹුරු පාටට හැරේ.



# මළකඩ රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ප්‍රොපිකොනසොල් 250 g/l EC | මි.ලී. 06 |
| හෙක්සාකොනසොල් 50 g/l EC | මි.ලී. 06 |
| හෙක්සාකොනසොල් 50 g/l SC | මි.ලී. 06 |
| ටෙබුකොනසොල් 250 g/l EW | මි.ලී. 06 |
| ප්‍රොපිනෙබ් 70% WP ( ඉහත දිලීරනාශකයක් යෙදීමෙන් පසු යොදන්න.) | ග්‍රෑම් 32 |
| මෙතිරාම් 55% + පයිරක්ලොස්ට්‍රොබින් 5% WG | ග්‍රෑම් 32 |
| ටෙබුකොනසොල් 200 g/l + ඇසොක්සිස්ට්‍රොබින් 120 SC | මි.ලී. 6.4 |

* අධික ලෙස ආසාදිත පත්‍ර ඉවත් කිරීමෙන් පසු දිලීරනාශක භාවිතා කරන්න.



## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ගැඹුරට සී සෑම.
- රෝගය සහිත වගාවක තිබූ ආධාරක කෝටු භාවිතා නොකිරීම.
- බෝග මාරුව සිදුකිරීම.
- පරණ බෝංචි වගාවන් අස්වැන්න නෙලා අවසන් වූ විගස ගලවා ඉවත්කිරීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බෝංචි මුල් කුණුවීමේ හා මැලවීමේ රෝගය



**ආසාදිත පත්‍රයක්**

මල් පිපීම හෝ කරල් ඇතිවීම ආරම්භ වන විට මේරූ පත්‍රවල නාරටි අතර කහ පැහැ වේ.



**ආසාදිත ශාකයක්**

පසුව පත්‍රයම කහ පැහැ වී හැලී යයි. ඉහළ පත්‍රවලට ක්‍රමයෙන් පැතිරී ශාකය මිය යයි.



**ආසාදිත ශාකයක මුදුන් මුලෙහි දික් කඩක්**

ශාකයේ මුදුන් මුල ඇතුලත රතු දුඹුරු පැහැයට හැරේ. අධික හානි අවස්ථාවල දිලීර ජාලයක් දැකිය හැක.

# බෝංචි මුල් කුණුවීමේ හා මැලවීමේ රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 50ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| තයෝෆනේට් මෙතිල් 50% + තිරාම් 30% WP | ග්‍රෑම් 50 |
| තයෝෆනේට් මෙතිල් 70% WP | ග්‍රෑම් 30 |
| තිරාම් 80% WP | ග්‍රෑම් 70 |
| ෆ්ලුටොලැනිල් 50% WP | ග්‍රෑම් 30 |
| කාබෙන්ඩසිම් 500 g/l SC | මි.ලී. 35 |
| කාබෙන්ඩසිම් 50% WP | ග්‍රෑම් 35 |

- පස තෙත් වන ලෙස මි.ලී. 50 ක් පමණ බීජ සිටු වන වලකට බීජ සිටුවන විට සහ පැලයේ මුල හා අවටට බීජ සිටුවා දින 14 පසුව රෝගය වලක්වා ගැනීම සඳහා යෙදීමට
- රෝග ලක්ෂණ මතුවන විට ස්ථානීයව වර්ග මීටර් 10 ප්‍රමාණයකට යෙදීම සඳහා



## වළක්වා ගැනීම

- පෙර කන්නයේ ඉතිරිවූ ශාක කොටස් විනාශකිරීම
- බිම් සැකසීමේදී අළුහුණු කාබනික පොහොර හා කර දහයියා යෙදීම.
- බීජ ප්‍රතිකාර කිරීම (බීජ කි. ග්‍රෑ. 1 කට තයොෆනේට් මෙතිල් 50% + තිරාම් 30% WP හෝ තයොෆනේට් මෙතිල් 70% WP ග්‍රෑම් 2ක් සිටුවීමට පැය 24 කට කලින් බීජ වලට දමා ජලය ස්වල්පයක් එක්කර මිශ්‍ර කිරීම).

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk